උපලේඛණ 01.

සේවා ගණයට අයත් තනතුරු

අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| මහජන සෞඛ්‍ය පරික්ෂක | 199 | III වන සහ II වන ශ්‍රේණිය | (අ) රෝග නිවාරණය උදෙසා පාරිසරික සෞඛ්‍ය කළමනාකරණය මූලික වගකීම කොට, ප්‍රජාවගේ බෝ වන හා බෝ නොවන රෝග පාලනය, ජල සනීපාරක්ෂාව, අපද්‍රව්‍ය කළමනාකරණය, වාහක පාලනය, නිවාස සෞඛ්‍ය, පාසැල් සෞඛ්‍ය, ආපදා කළමනාකරණය, සෞඛ්‍ය ප්‍රවර්ධනය හා මහජන සෞඛ්‍ය නීතිය ක්‍රියාත්මක කිරීම තුලින් සෞභාග්‍යමත් සමාජයක් බිහි කිරීමට දායක වීම. |
| | | I වන ශ්‍රේණිය හා අධි ශ්‍රේණිය | (ආ) ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව අදාල ආයතන හෝ බල ප්‍රදේශවල මහජන සෞඛ්‍ය පරික්ෂක වරුන්ගේ අධීක්ෂණ කටයුතු |
| පරිපාලන මහජන සෞඛ්‍ය පරික්ෂක | 21 | I වන ශ්‍රේණිය | පත් කරන ආයතනයේ හෝ බල ප්‍රදේශයට අදාල වන පරිදි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ගේ අධීක්ෂණය හා පරීක්ෂණ කටයුතු සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම, කාර්යය සාධනය ඇගයීම, නෛතික කටයුතු සඳහා සහායවීම, නඩු මෙහෙය වීම, මහජන සෞඛ්‍ය ගැටලු විසඳීම |
| ආචාර්ය මහජන සෞඛ්‍ය පරික්ෂක | 2 | I වන ශ්‍රේණිය | මහජන සෞඛ්‍ය පරික්ෂක ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්ණ හා ප්‍රශ්ණ පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරික්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබා දීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම,<br><br>අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා |

මහජන සෞඛ්‍ය පරීක්ෂණ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය
... විසින්
2019. 11. 20 දින
... සහතික කරමි.

වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019. 11. 25.

| | | | |
|---|---|---|---|
| | | | කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය, පුහුණු මධ්‍යස්ථාන තුළ විනය පවත්වාගෙන යාම,<br><br>පුහුණු මධ්‍යස්ථානවල අවශ්‍යතා පිළිබඳ සහකාර අධ්‍යක්ෂ (පුහුණු) දැණුවත් කිරීම හා තනතුරට අදාලව පවරණු ලබන වෙනත් රාජකාරී කටයුතු |
| ආහාර හා ඖෂධ පරීක්ෂක | 4 | I වන ශ්‍රේණිය | ආහාර පවිත්‍ර තාවය පිළිබඳ නීතිමය කටයුතු සම්පාදනය කිරීම, ආහාර ස්වස්ථාවය හා ප්‍රමිතිය පිළිබඳ මූලික කටයුතු ක්‍රියාත්මක කිරීම, වෙළඳුන් හා පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙය වීම, ආනයන හා අපනයන ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කිරීම හා අදාල සහතික පත් නිකුත් කිරීම, ලෝක වෙළඳ සංවිධානය (W.T.O )යටතේ පිහිටුවා ඇති සනීපාරක්ෂාව හා ශාක සනීපාරක්ෂාව පිළිබඳ විමසීම් ඒකකය(S.P.S) කටයුතු, ලැබෙන පැමිණිලි පිළිබඳ විශේෂ පරීක්ෂණ සිදු කිරීම.<br>පානීය බෝතල් ජල නිපැයුම් ස්ථාන ලියා පදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය කරන පරීක්ෂා කිරීම්වල දී නිලධාරීන් කණ්ඩායම් සමග කටයුතු කිරීම.<br>ආහාර උපදේශක කමිටුවේ තීරණ පිළිබඳ පියවර ගැනීම.<br><br>ජාතික කොඩෙක්ස් කමිටුවේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ දී සහාය වීම ආදී කටයුතු<br><br>විලවුන් උපකරණ හා ඖෂධ පනතට අදාලව නීතිමය කටයුතු හා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, උක්ත පණත යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා බලය ලත් නිලධාරීන් පුහුණු කිරීම, ඖෂධ තොග හා සිල්ලර බලපත්‍ර නිර්දේශ කිරීම, වෙළඳ පොලේ ඇති විලවුන් හා ඖෂධවල තත්වය පිළිබඳව පසු විපරම් කිරීම සඳහා නියැදි ලබා ගැනීම, විලවුන් උපකරණ හා ඖෂධ නිෂ්පාදනයේ දී යහපත් නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳව පරීක්ෂා කිරීම, මහජන පැමිණිලි විමර්ශනය කිරීම හා ඊට අදාලව නීතිමය පියවර ගැනීම, මහජනයා , ඖෂධ ශාලා හිමියන් හා මධ්‍යාවේදීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ලියාපදිංචි නොකළ විලවුන් උපකරණ හා ඖෂධ සඳහා නීතිමය පියවර ගැනීම. |

මහජන සේවා පරිෂ්කර නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය [illegible] විසින් 2019.11.20 දින අනුමත කරන ලද බව සහතික කරමි.
වැඩ බලන අමාත්‍යාංශ ලේකම්
දිනය: 2019.11.25

## උපලේඛණ 02

මහජන සෞඛ්‍ය පරීක්ෂක III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්ණ පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්යය පටිපාටික රීති | රචනා ප්‍රශ්න 08 න් සමන්විත වන අතර ඉන් ප්‍රශ්ණ 05 පිළිතුරු සැපයිය යුතුය | පැය 03 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | රචනා ප්‍රශ්ණ 08 න් සමන්විත වන අතර ඉන් ප්‍රශ්ණ 05 පිළිතුරු සැපයිය යුතුය | පැය 03 | 100 | 40% |

02.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්යය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br>IV, XII, XIII, XIV, XLVII, XLVIII |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි මත සැකසේ.<br><br>**I** වන පරිච්ඡේදය -වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම ( මුදල් රෙගුලාසි 1 සිට 68 දක්වා)<br>**III** වන පරිච්ඡේදය -මූල්‍ය කලමනාකරණය හා උත්තර දායී බව, ප්‍රධාන ගණක නිලධාරී, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්යය පැවරීම,<br>( මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා |

මහජන සෞඛ්‍ය පරීක්ෂක
නිලධාරීන් සඳහා වන සේවා
ඇතුළත් කිරීමේ හා උසස් කිරීමේ පරිපාටිය
ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.11.20 දින
අනුමත කරන ලද බව
සහතික කරමි.

වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.11.25.

## උපලේඛණ 03

මහජන සෞඛ්‍ය පරික්ෂක II වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා වූ කාර්යක්‍ෂමතා කඩඉම් පරික්ෂණය

01. විභාගය පිළිබඳ විස්තර :

(අ) පොදු පරීක්ෂණය :

| ප්‍රශ්ණ පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්යය පටිපාටික රිති | රචනා ප්‍රශ්ණ 07 කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්ණ 04 ට පිළිතුරු සැපයිය යුතුය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | රචනා ප්‍රශ්ණ 07 කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්ණ 04 ට පිළිතුරු සැපයිය යුතුය | පැය 02 | 100 | 40% |

(ආ) දෙපාර්තමේන්තු පරීක්ෂණය :

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ ලිඛිත | රචනා ප්‍රශ්ණ 08 කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්ණ 05 පිළිතුරු සැපයිය යුතුය | පැය 03 | 100 | 40% |
| විෂයානුබද්ධ වාචික | විෂය ක්ෂෙත්‍රය ඇසුරින් සහ රාජකාරියේ දී මුහුණපාන ගැටළු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. | විනාඩි 15 | 100 | 40% |
| විෂයානුබද්ධ ප්‍රායෝගික | විෂය ක්ෂෙත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණයකි. | පරීක්ෂණය අනුව | 100 | 40% |

05.විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත මෙම ප්‍රශ්ණ පත්‍රය සැකසේ.<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br><br>XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි පහත සඳහන් පරිච්ඡේදය මත සැකසේ.<br>1) VI වන පරිච්ඡේදය -<br>ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩලය, අයිරාව බැංකු ගිණුම් (මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා) |


මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා වූ කඩඉම් [illegible]
[illegible] විසින්
2019.11.20 දින
අනුමත කරන ලද බව
සහතික කරමි.
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.11.25




17

| | |
|---|---|
| | 2) XIII වන පරිච්ඡේදය -<br>සැපයුම් වැඩ හා සේවා :- සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණය, ගබඩා කරන ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර්, පරිපාටියෙන් බැහැර වීම.<br>(මුදල් රෙගුලාසි 708 සිට 775 දක්වා) |
| විෂයානුබද්ධ පරීක්ෂණය – ලිඛිත විභාගය | 1. සාමාන්‍ය පරිපාලනය<br>2. රක්තවේදය<br>3. ක්ෂුද්‍ර ජීවී විද්‍යාව<br>4. අධ්‍යාපන විද්‍යාව<br>5. පරපෝෂිතවේදය<br>6. වෛද්‍ය කීට විද්‍යාව<br>7. ආහාර සුරක්ෂිතතාව හා ස්වස්ථ තාවය<br>8. මානසික සෞඛ්‍ය<br>9. පරිසර සෞඛ්‍ය<br>10. ගොඩනැගිලි නිර්මාණය<br>11. බෝවන රෝග හා වසංගත වේදී ආවේක්ෂණය<br>12. බෝ නොවන රෝග<br>13. පවුල් සෞඛ්‍ය<br>14. පාසැල් සෞඛ්‍ය<br>15. සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රවර්ධන<br>16. සෞඛ්‍ය සැලසුම් හා කළමනාකරණය<br>17. මහජන සෞඛ්‍ය නීතිය<br>18. ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය<br>19. ප්‍රථමාධාර |
| විෂයානුබද්ධ පරීක්ෂණය ප්‍රායෝගික පරීක්ෂණය | 1. පාසැල් සෞඛ්‍ය<br>2. මහජන සෞඛ්‍ය නීතිය<br>3. කාර්යාල පටිපාටිය<br>4. වසංගතවේදිය ආවේක්ෂණය ක්‍රියාවලිය |
| විෂයානුබද්ධ පරීක්ෂණය වාචික පරීක්ෂණය | විෂය ක්ෂේත්‍රයට අදාලව හා සේවයේ යෙදීමේ දී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරීක්ෂණය කි. |



මහජන සෞඛ්‍ය පරීක්ෂක
නිලධාරීන් සඳහා වන
බඳවා ගැනීමේ හා උසස්
කිරීමේ පරිපාටිය'
ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019.11.20 දින
අනුමත කොට ඇති බව
සහතික කරමි.

වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.11.25.

## උපලේඛණ 04

මහජන සෞඛ්‍ය පරීක්ෂක I වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ (බහුවරණ) | රචනා ප්‍රශ්ණ 50 න් සමන්විත වේ | පැය 02 | 50 | 40% |
| විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) | මෙම පළමු ප්‍රශ්ණය අනිවාර්ය වන අතර ඉතිරි ප්‍රශ්න 05 න් 03 ට පිළිතුරු සැපයිය යුතුය. | පැය 02 | 100 | 40% |

02. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ (බහුවරණ)<br><br>විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) | 1. පරිසර සෞඛ්‍ය<br>2. ආහාර සුරක්ෂිතතාව හා ස්වස්ථාව<br>3. බෝ නොවන රෝග<br>4. ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය<br>5. කාර්යාල පටිපාටිය<br>6. මහජන සෞඛ්‍ය නීතිය<br>7. සෞඛ්‍ය සැලසුම් හා කළමනාකරණය<br>8. බෝවන රෝග හා වසංගතවේදීය ආවේක්ෂණය<br>9. ජීව සංඛ්‍යා<br>10. සෞඛ්‍ය පර්යේෂණය<br>11. ව්‍යාපෘති |

2019.11.20 දින
2019.11.25

උපලේඛන 05

**පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුර සඳහා බඳවාගැනීම සඳහා වන විස්තරාත්මක ලකුණු පටිපාටිය**

(1) සේවා පළපුරුද්ද -උපරිම ලකුණු 50

- I ශ්‍රේණියේ එක් වසරකට ලකුණු 03 බැගින් -උපරිම ලකුණු 30
- අධි ශ්‍රේණියේ එක් වසරකට ලකුණු 04 බැගින් - උපරිම ලකුණු 20

(2) උසස් අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 20

I.විද්‍යාවේදි (ජීව විද්‍යා), නීතිවේදී, ශාස්ත්‍රවේදී (සමාජ විද්‍යා), පෝෂණවේදී උපාධිය හෝ ඒ හා සමාන ලෙස සැලකිය හැකි වෙනත් උපාධියක් සඳහා - (ලකුණු 10)
II. වෙනත් විද්‍යාවේදී උපාධියක් හෝ ඒ හා සමාන ලෙස සැලකිය හැකි වෙනත් උපාධියක් සඳහා- (ලකුණු 08)
III.වෙනත් ඕනෑම උපාධියක් සඳහා (ලකුණු 05)
IV.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් මගින් ලබා ගත් වෙනත් අදාල ඩිප්ලෝමාවක් සඳහා (ලකුණු 10)

(3) විශේෂ කුසලතාවයන් සඳහා -උපරිම ලකුණු 10

අදාල වෘත්තිය ක්ෂෙත්‍රය පිළිබඳව ප්‍රකාශයට පත් කර ඇති ප්‍රකාශන,පොත්පත්,උපදෙස් හා මඟ පෙන්වීම්-එක් කුසලතාවයක් සඳහා ලකුණු 02 බැගින්

(4) ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය – උපරිම ලකුණු 15

I. අ.පො.ස. (සා. පෙළ) සම්මාන සාමාර්ථයක් සඳහා - ලකුණු 08
II.අ.පො.ස. (සා.පෙළ) විශිෂ්ඨ සම්මාන සාමාර්ථයක් සඳහා - ලකුණු 10
III.පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු කාලයකදී ලබාගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක් / අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස සමත්වී ඇත්නම් - ලකුණු 15
IV .ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රථම උපාධිය/පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා සමත්වී තිබීම – ලකුණු 15
**(ඉහලම සුදුසුකමට පමණක් ලකුණු ලබාදේ)**

(5) සම්මුඛ පරීක්ෂක කුසලතාවය සඳහා - උපරිම ලකුණු 05


මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය
ගරු ආණ්ඩුකාරතුමා විසින්
2019. 11. 20 දින
අනුමත කරන ලද බව
සහතික කරමි.
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019. 11. 25.

උපලේඛන 06

**<u>මහජන සෞඛ්‍ය පරීක්ෂක (ආචාර්ය) තනතුර සඳහා බඳවාගැනීම සඳහා වන විස්තරාත්මක ලකුණු පටිපාටිය</u>**

(1) සේවා පළපුරුද්ද -උපරිම ලකුණු 40

- II ශ්‍රේණියේ එක් වසරකට ලකුණු 02 බැගින් ලබා දෙනු ලැබේ.
- I ශ්‍රේණියේ එක් වසරකට ලකුණු 03 බැගින් ලබා දෙනු ලැබේ.

(2) ඉගැන්වීමේ පළපුරුද්ද -උපරිම ලකුණු 05

එක් වසරකට ලකුණු 02 බැගින්
(අවම කාලය මාස 06 ක් ඉක්මවූ විට ලකුණු 01 ක් ලබා දෙනු ලැබේ)

(3) උසස් අධ්‍යාපන සුදුසුකම් -උපරිම ලකුණු 20

I.විද්‍යාවේදී (ජීව විද්‍යා), නිතිවේදී, ශාස්ත්‍රවේදී (සමාජ විද්‍යා), පෝෂණවේදී උපාධිය හෝ ඒ හා සමාන ලෙස සැලකිය හැකි වෙනත් උපාධියක් සඳහා - (ලකුණු 10)
II. වෙනත් විද්‍යාවේදී උපාධියක් හෝ ඒ හා සමාන ලෙස සැලකිය හැකි වෙනත් උපාධියක් සඳහා- (ලකුණු 08)
III.වෙනත් ඕනෑම උපාධියක් සඳහා (ලකුණු 05)
IV.විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ සෞඛ්‍ය විෂයභාර රේඛීය අමාත්‍යංශය විසින් පිළිගත් ආයතනයක් මගින් ලබා දෙන අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා/වෙනත් අදාල ඩිප්ලෝමාවක් සඳහා (ලකුණු- 10)

(4) විශේෂ කුසලතාවයන් සඳහා -උපරිම ලකුණු 15

අදාල වෘත්තිය ක්ෂෙත්‍රය පිළිබඳව ප්‍රකාශයට පත් කර ඇති ප්‍රකාශන,පොත්පත්,උපදෙස් හා මඟ පෙන්වීම්-එක් කුසලතාවයක් සඳහා ලකුණු 02 බැගින්

(5) ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය – උපරිම ලකුණු 15

I. අ.පො.ස. (සා. පෙළ) සම්මාන සාමාර්ථයක් සඳහා - ලකුණු 08
II.අ.පො.ස. (සා.පෙළ) විශිෂ්ඨ සම්මාන සාමාර්ථයක් සඳහා - ලකුණු 10
III.පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු කාලයකදී ලබාගත් ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමාවක්/අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ඉංග්‍රීසි භාෂාව විෂයක් ලෙස සමත් වී ඇත්නම් ඒ සඳහා -ලකුණු 15
IV.ඉංග්‍රීසි මාධ්‍ය ප්‍රථම උපාධිය/පශ්චාත් උපාධිය/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හදාරා සමත්වී තිබීම – (ලකුණු 15)
**(ඉහලම සුදුසුකමට පමණක් ලකුණු ලබාදේ)**

(6) සම්මුඛ පරීක්ෂක කුසලතාවය සඳහා - උපරිම ලකුණු 05

2019.11.20
වැඩබලන ආණ්ඩුකාරවර ලේකම්
2019.11.25
දිනය